# "රටක් වටිනා පොතක්" පොත් 10,000ක් ලිවීමේ ජාතික වැඩසටහන

## ග්‍රන්ථ රචනා කිරීම සඳහා උපදෙස්

මෙම ව්‍යාපෘතිය මගින් දිවයිනේ සියලුම පාසල්, පිරිවෙන්, පෞද්ගලික හා ජාත්‍යන්තර පාසල්වල ඉගෙනුම ලබන පළමුවන ශ්‍රේණියේ සිට 13 ශ්‍රේණිය දක්වා ශිෂ්‍ය ස්වාමීන් වහන්සේ, ශිෂ්‍ය ශිෂ්‍යාවනට ස්වකීය නිර්මාණ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන ඕනෑම භාෂා මාධ්‍යයකින් ඉදිරිපත් කළ හැකිය.

ළමා කෘති කාණ්ඩ 3ක් ඔස්සේ නිර්මාණය කළ හැක.

- 1 වසරේ සිට 5වසර
- 6 වසරේ සිට 10 වසර
- 11 වසරේ සිට 13 වසර

ඒ අනුව මෙම කාණ්ඩ සඳහා වෙන වෙනම නිර්නායක හා උපදෙස්.

**1. කතාවේ අන්තර්ගතය සකස් කිරීම**

කතා තේමාව තෝරා ගැනීමේදී විවිධ සාහිත්‍ය ශානර අතරින් තමන් තෝරා ගන්නා ශානර කාණ්ඩය තෝරා ගැනීම සිදු කළ යුතුය. 01 ශ්‍රේණිය සිට 13 ශ්‍රේණිය දක්වා සියලු සිසුන්ට පහත සඳහන් ශානරවලින් එකක් තෝරාගෙන නිර්මාණ ඉදිරිපත් කළ හැකිය.

I. ළමා කතන්දර
II. යොවුන් සාහිත්‍ය කෘති
III. පර්යේෂණ කෘති
IV. විෂයානුබද්ධ කෘති
V. නිර්මාණාත්මක සාහිත්‍ය කෘති - නිර්මාණාත්මක කෘති යටතේ පහත සඳහන් ක්ෂේත්‍ර ඔස්සේ ග්‍රන්ථ රචනා කළ හැක.


- නව කතා
- කෙටිකතා
- කාව්‍ය රචනා
- නාට්‍ය රචනා
- පරිවර්තන
- මිත්‍යා කතා
- ජන කතා
- ඓතිහාසික කතා
- උපමා කතා
- චරිතාපදාන
- මායා කතා
- සුරංගනා කතා
- අතිශයෝක්ති කතා
- අභිරහස් කතා
- පරිසර චිත්ති
- ස්වයංචරිතාපදාන
- විද්‍යා ප්‍රබන්ධ
- ආගමික කතා
- පුරාවෘත්ත
- වීර කතා
- මිශ්‍ර

| | වයස් කාණ්ඩය | රචනා කළ හැකි පොත් | උපදෙස් |
|---|---|---|---|
| 01 | 1 වසරේ සිට 5 වසර | ළමා කතාන්දර | • පිටු ගණන අවම පිටු 16ක් වීම<br>• අකුරු ප්‍රමාණය 14/16<br>• අවම වර්ණ චිත්‍ර 5ක් සහිත වීම<br>• පේළි අතර පරතරය Double Space |
| 02 | 6 වසරේ සිට 13 වසර | ළමා කතාන්දර | • පිටු ගණන අවම පිටු 16ක් වීම<br>• අකුරු ප්‍රමාණය 14/16<br>• අවම වර්ණ චිත්‍ර 5ක් සහිත වීම<br>• පේළි අතර පරතරය Double Space |
| | | යොවුන් සාහිත්‍ය කෘති | • මුද්‍රණයේදී පිටු අවම 49ක් විය යුතුය<br>• අකුරු ප්‍රමාණය 12<br>• පේළි අතර පරතරය Single Space<br>• |
| | | පර්යේෂණ කෘති<br>විෂයානුබද්ධ කෘති<br>ශාස්ත්‍රීය කෘති | • මුද්‍රණයේදී පිටු අවම 49ක් විය යුතුය<br>• අකුරු ප්‍රමාණය 12<br>• පේළි අතර පරතරය Single Space<br>• අදාළ කෘතිවල අන්තර්ගය පිළිබඳ වගකීම ඔබ සතුය<br>• විෂය කරුණු සඳහා අවශ්‍ය අවස්ථාවලදී පමණක් පින්තූර හා චිත්‍ර භාවිත කළ යුතුය<br>• සාහිත්‍ය විමර්ශනයක් හෝ උපුටා ගැනිමක් සිදු කරන අවස්ථාවේදී නිවැරදිව පාද සටහන් යෙදීම<br>• මෙවැනි කෘති රචනා කිරීමේදී අනුගමනය කළ යුතු මූලික ආචාර ධර්ම අනුගමනය කිරීම<br>• ආශ්‍රිත ග්‍රන්ථ දැක්වීමේදී APA හෝ Harvard ක්‍රමය භාවිත කළ යුතුය |
| | | නිර්මාණාත්මක සාහිත්‍ය කෘති<br>• නවකතා<br>• කෙටිකතා<br>• පරිවර්තන<br>• කවි<br>• ගීත<br>• නාට්‍ය හා අනෙකුත් නිර්මාණාත්මක සාහිත්‍ය කෘති | • මුද්‍රණයේදී පිටු අවම 49ක් විය යුතුය<br>• අකුරු ප්‍රමාණය 12<br>• පේළි අතර පරතරය Single Space<br>• අදාළ කෘතිවල අන්තර්ගය පිළිබඳ වගකීම ඔබ සතුය<br>• කෙටිකතා සංග්‍රහයකදී අවම කෙටි කතා 5ක්වත් තිබිය යුතුය<br>• පරිවර්තන කාර්යයක් සඳහා අවශ්‍ය කරනු ලබන අවසර ගැනීම් හා අදාළ මූලික කටයුතු සිදු කර ගැනීම<br>• පරිවර්තන කාර්යයට අදාළ මුල් පිටපත අත්පිටපත සමග ඉදිරිපත් කළ යුතුය. |

මීට අමතරව

- ළමා ග්‍රන්ථයක/ වෙනත් ප්‍රබන්ධ කතාවක කතා වස්තුව ගොඩනැගීමේදී කතා තේමාවට ගැලපෙන අයුරින් කතා වස්තුව ගොඩනැගිය යුතුය. එසේම චරිත හා සංසිද්ධීන් මනාව සංකලනය කරගැනීම සිදු කළ යුතුය.

- මෙහිදී කතාවේ ආරම්භය, කතාව ගලා ගෙන යාම, උච්ච අවස්ථාව හා අවසානය ඉතා හොඳින් නිර්මාණය කර ගත යුතුය.




නිදසුන් :

ලෝකයේ දරුවන් අතර ජනප්‍රිය සුරංගනා කතාවක් වන හිම කුමාරි කතාව "එකෝමත් එක රටක... යනුවෙන් ආරම්භ කර කුමරිය නපුරු කුඩම්මාගේ විවිධ නපුරුකම්වලට ගොදුරු වෙමින් කතාව ගලාගෙන යනු ලැබේ. එහිදී එක් අවස්ථාවක කුමරිය විෂ සහිත ඇපල් ගෙඩිය ආහාරයට ගෙන සිහිසුන් වීම කතාවේ උච්චතම අවස්ථාවයි. පසුව අසුපිටින් එන කුමාරයා හිම කුමරිය සනීප කර රැගෙන යාම කතාවේ අවසානයයි... "

- ඔබ විසින් ඉදිරිපත් කරනු ලබන කෘති ස්වයං නිර්මාණයක් වීම අනිවාර්ය අතර මීට පෙර කිසිදු අවස්ථාවක ප්‍රසිද්ධ ලියවිල්ලක් ලෙස ප්‍රකාශයට පත් වූවක් නොවීම හා එවන් කෘතියකින් උපුටා ගැනීමක් නොවිය යුතුය. එසේම වෙනත් ආගමකට, ජාතියකට, සංස්කෘතියකට හෝ පුද්ගලයෙකුට මොනම ආකාරයකින් වත් හානියක් සිදු වන දේ අන්තර්ගත නොවිය යුතුය.

- පර්යේෂණ කෘතියක් හෝ ව්‍යාපෘති වාර්තා ඉදිරිපත් කිරීමේදී එය පර්යේෂණ වාර්තා ආකෘතියෙන් බැහැරව ග්‍රන්ථයක් ලෙස සකස් කර ඉදිරිපත් කළ යුතුය.

- ඉදිරිපත් කරනු ලබන සෑම අත්පිටපතක්ම පරිගණක ගත කර ඉදිරිපත් කළ යුතුය. පරිගණක යතුරු ලියනය කිරීමේදී යුනිකෝඩ් (Iskoola Pota- Sinhala / Latha- Tamil) විය යුතුය. යම් හෙයකින් ඔබට යුනිකෝඩ් ෆොන්ට් භාවිත කළ නොහැකි නම් FMAbhaya, Times New Romen, FM Bamini භාවිත කළ හැක.

- ළමා කතන්දර පොත් සඳහා භාවිත කරනු ලබන චිත්‍ර/ ඡායාරූප අන්තර්ජාලය මගින් ලබා ගත් චිත්‍ර/ ඡායාරූප නොවිය යුතුය අතර අදාළ කෘතිය සඳහාම නිර්මාණය කළ ඒවා විය යුතුය. චිත්‍ර අඳිනු ලබන්නේ වෙනත් අයකු නම් ඔහුගේ / ඇයගේ නම ග්‍රන්ථ නාම පිටුවේ පසු පිටුවෙහි සඳහන් කළ යුතුය.

- උපුටා ගැනීම් හෝ ආශ්‍රිත ග්‍රන්ථ දැක්වීමේදී APA ක්‍රමය හෝ Harvard ක්‍රමය අනුගමනය කළ යුතුය. පහත උදාහරණය බලන්න

| | | |
|---|---|---|
| කතුවරයාගේ නම | :- | පී.තේන්නබදු |
| වර්ෂය | :- | 1959 |
| පොතේ නම | :- | සිංහල රචනය හා සාහිත්‍ය රසාස්වාදය |
| ප්‍රකාශකයා | :- | කොළඹ ඇපොතිකරීස් සමාගම |
| ප්‍රකාශිත නගරය | :- | කොළඹ. |

මෙම තොරතුරු ආශ්‍රිත ග්‍රන්ථ නාම ලේඛනයක සඳහන් කරන්නේ මෙසේය

**තේන්නබදු, පී. (1959). සිංහල රචනය හා සාහිත්‍ය රසාස්වාදය. කොළඹ : ඇපොතිකරීස්.**

- ග්‍රන්ථයෙහි පෙළ සහිත කොටස සම්මත කඩදාසි ප්‍රමාණය අනුව වෙනස් විය හැකිය. සාමාන්‍ය A5 ප්‍රමාණයේ කෘතියක නම් උස අගල් 7 (දිවෙන ග්‍රන්ථ නාමය හා පාද සටහන් ඇතුලුව), පළල අගල් 4ක් විය යුතුය. එනම් ලියනු ලබන පිටුවක වට ඉඩ ප්‍රමාණය වම් පසින් අගල් 1.5ක් හා ඉතිරි තුන් පැත්ත අගල් 1ක බැගින් තැබිය යුතුය.

- පොතේ ප්‍රමාණය තෝරා ගැනීමේදී ළමා ග්‍රන්ථ සඳහා වැඩි වශයෙන් භාවිත කරනු ලබන්නේ පහත සඳහන් ප්‍රමාණයන්ට අනුව සැකසූ කෘතිය.

| | |
|---|---|
| A4 | 210mm x 297mm |
| B5 | 176mm x 250mm |

වෙනත් ශානරයන්හි කෘති සඳහා පොතේ ප්‍රමාණය තෝරා ගැනීමේදී

| | |
|---|---|
| A5 | 148mm x 210mm |
| A4 | 210mm x 297mm |
| B5 | 176mm x 250mm |

යන ප්‍රමාණයන් භාවිත කළ හැක.

### 2. මුල්පිටු හා පිටකවරය සකස් කිරීම

- මුල් පිටු සකස් කිරීමේදී ළමා ග්‍රන්ථයක නම් ග්‍රන්ථ නාම පිටුව හා ග්‍රන්ථ නාම පිටුවේ පසු පිටුව පමණක් යෙදීම සුදුසුය.

- නමුත් වෙනත් කෘතියකදී අර්ධ ග්‍රන්ථ නාම පිටුව, අර්ධ ග්‍රන්ථ නාම පිටුවේ පසු පිටුව, ග්‍රන්ථ නාම පිටුව, ග්‍රන්ථ නාම පිටුවේ පසු පිටුව, ස්තූතිය, පෙරවදන හා පටුන පිළිවෙළින් යෙදිය යුතුය. මේ සඳහා වැඩි විස්තර ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ නිවහන් පිටුවේ ඇති "ග්‍රන්ථ සැකැස්මේ ක්‍රමවේදය" හා "ළමා ග්‍රන්ථ සැකැස්මේ ක්‍රමවේදය" නියමු ග්‍රන්ථ අධ්‍යයනය කිරීම සුදුසුය. (www.natlib.lk)

**ළමා ග්‍රන්ථ සඳහා මුල් පිටු සකස් කිරීම**

I. ග්‍රන්ථ නාම පිටුව (මුල් පිටුව) - පොතේ නම, කර්තෘගේ නම, චිත්‍ර නිර්මාණ කරුගේ නම

II. ග්‍රන්ථ නාම පිටුවේ පසු පිටුව (මුල් පිටුවේ පසු පිටුව) - කර්තෘගේ නම, පොතේ නම, වර්ෂය, ග්‍රන්ථය සඳහා දායක වූ අය (චිත්‍ර නිර්මාණ කරුගේ නම, ග්‍රන්ථයෙහි පිටකවර සැලසුම්කරණය, පරිගණක අක්ෂර සංයෝජන, ඡායාරූප, යන කාර්යය සඳහා දායක වූ පුද්ගලයන් හෝ ආයතන නාම සහ ලිපින අදාළ ශීර්ෂ යටතේ සඳහන් කළ හැකිය.)

III. පිදුම - අවශ්‍ය ඕනෑම කෙනෙකුට සංක්ෂිප්ත හා සරලව තනි පිටුවක යෙදිය යුතුය.

වැඩිදුර තොරතුරු සඳහා "ළමා ග්‍රන්ථ සැකැස්මේ ක්‍රමවේදය" නියමු අත්පොත පරිශීලනය කරන්න. (www.natlib.lk)

**ළමා නොවන වෙනත් ශානර සඳහා මුල් පිටු සකස් කිරීම**

I. අර්ධ ග්‍රන්ථ නාම පිටුව (මුල් පිටුව) - පොතේ නම

II. අර්ධ ග්‍රන්ථ නාම පිටුවේ පසු පිටුව (මුල් පිටුවේ පසු පිටුව) - කර්තෘගේ වෙනත් කෘති ඇත්නම් සඳහන් කරන්න

III. ග්‍රන්ථ නාම පිටුව (දෙවන මුල් පිටුව) - පොතේ නම, කර්තෘගේ නම

IV. ග්‍රන්ථ නාම පිටුවේ පසු පිටුව (දෙවන පිටුවේ පසු පිටුව) - කර්තෘගේ නම, පොතේ නම, වර්ෂය, ග්‍රන්ථය සඳහා දායක වූ අය (චිත්‍ර නිර්මාණකරුගේ නම, ග්‍රන්ථයෙහි පිටකවර සැලසුම්කරණය, පරිගණක අක්ෂර සංයෝජන, ඡායාරූප, යන කාර්යය සඳහා දායක වූ පුද්ගලයන් හෝ ආයතන නාම සහ ලිපින අදාළ ශීර්ෂ යටතේ සඳහන් කළ හැකිය. )

V. පිදුම - අවශ්‍ය ඕනෑම කෙනෙකුට සංක්ෂිප්ත හා සරලව තනි පිටුවක යෙදිය යුතුය.

VI. පෙරවදන - අදාළ කෘතිය පිළිබඳ වෙනත් ප්‍රවීණයකු විසින් ලියන ලද පිටු 2කට නොවැඩි සටහන (මෙහිදී පෙරවදන වෙනත් ප්‍රවීණයකු විසින් ලිවීම අත්‍යාවශ්‍ය නොවන අතර කර්තෘ විසින්ම ලිවීම සිදු කළ හැකිය.)

VII. හැඳින්වීම - කර්තෘ විසින් කෘතිය නිර්මාණය කිරීමට පසුබිම් වූ කරුණු පිළිබඳ සංක්ෂිප්ත සටහන.

VIII. පටුන :- ප්‍රධාන මාතෘකා අනුමාතෘකා පිටු අංක සහිතව දැක්විය යුතුය.

- ග්‍රන්ථයෙහි මුල් පිටු සඳහා පෙරවදන, හැඳින්වීම, ඇතුළත් කරන්නේ නම් රෝම ඉලක්කම් යෙදිය යුතුය.

- ළමා කතන්දරය හෝ අන්තර්ගතය ආරම්භ වන පිටුවේ සිට පිටු අංකනය කිරීම (පිටු අංක 1) සිදු කළ යුතුය.

- පිටකවරය නිර්මාණය කිරීමේදී කතාවේ සමස්ත අර්ථය නියෝජනය වන අයුරින් නිර්මාණය කළ යුතුය. පිට කවරය නිර්මාණය කිරීමේදී වර්ණ භාවිතය හා ආකර්ශණය පිළිබඳව සැළකිලිමත් විය යුතුය. පිටකවරයෙහි කර්තෘගේ නම, ඉගෙනුම ලබන ශ්‍රේණිය හා ග්‍රන්ථ නාමය පැහැදිලිව සටහන් විය යුතුය.

- පොත බැඳීමේදී Spiral ක්‍රමය භාවිත කළ යුතුය. නිවැරදිව සකස් කරන ලද පරිගණක අත්පිටපතත් සමග PDF කළ මෘදු පිටපත (CD) සංයුක්ත තැටියක් මගින් ලබා දිය යුතුය.

- අත්පිටපත ඉදිරිපත් කිරීමේදී නිවැරදිව පුරවන ලද අයඳුම්පත්‍රය අත්පිටපතෙහි, අමුණා ඒ සමග ඉදිරිපත් කළ යුතුය.

සැ.යු - නමුත්, සිසුන් විසින් තම නිර්මාණ ඉදිරිපත් කිරීමේදී මෘදු පිටපතක් සකස්කර ගැනීමට නොහැකිවීම, මෙම වැඩසටහනට ඇතුළත්වීමට කිසිදු බාධාවක් කර නොගත යුතුය. එවැනි අවස්ථාවකදී පැහැදිලි අත් අකුරින් ලියන ලද පිටපත භාරගෙන ඉදිරි ඇගයීම් සිදු කිරීමට විදුහල්පති ඇතුළු සියලුම නිලධාරීන් කටයුතු කළ යුතුය. එසේම ලකුණු ලබාදීමේදී නිර්මාණාත්මකභාවය හා භාෂා භාවිතය සඳහා වැඩි අවධානයක් යොමු කිරීම අවශ්‍ය වේ.

## රටක් වටින පොතක්
## පොත් ඉදිරිපත් කිරීමේ අයදුම්පත්‍රය

01. කර්තෘගේ නම : ..........................................................................................................

02. කර්තෘගේ උපන්දිනය : වර්ෂය [   ] මාසය [   ] දිනය [   ]

03. ඉගෙනුම ලබන පාසල :.....................................................................................................

04. ඉගෙනුම ලබන ශ්‍රේණිය :..................................................................................................

05. ඉදිරිපත් කරනු ලබන අත්පිටපතේ නම :.............................................................................

06. විෂය ක්ෂේත්‍රය :...........................................................................................................

07. පිටු ගණන :...................................................................................................................

08. ළමා කෘතියක් නම් චිත්‍ර ගණන :......................................................................................

09. ළමා කතාන්දර පොතක් නම් චිත්‍ර නිර්මාණකරුගේ නම :........................................................

10. කෘතිය සකස් කර ඇති අකුරු වර්ගය (Font Style) :.................................................................